# මනස පිළිබඳ විවිධ දාර්ශනික මතවාද පිළිබඳ විමර්ශනයක්

එස්. පී. මොල්ලිගොඩ

මිනිසා මෙලොව බිහි වූ දා සිටම තමාගේ මනසේ ස්වභාවය හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව විමර්ශනය කිරීමට පෙළඹී සිටියේය. මෙවැනි විමර්ශන ඉන්දියානු, චීන, ග්‍රීක, ඊජිප්තු, බැබිලෝනියානු ආදී සෑම පුරාණ ශිෂ්ටාචාරයකම දැකිය හැකිය. අවුරුදු පන්දාහක් තරම් පැරණි යැයි සැලකෙන මෙම ශිෂ්ටාචාරවල මනස පිළිබඳව විමර්ශන හෙවත් මනෝ විද්‍යාව පැවතුනේ දාර්ශනික විෂයයක් ලෙසිනි.[1] පැරණි විෂයය විශ්ලේෂණයට අනුව වෛද්‍ය ආදී ස්වභාවික විද්‍යා පිළිබඳ අධ්‍යයනය කරන විෂයයන් ස්වභාවික දර්ශන වශයෙන් වෙන්කර ඇත. මානව සමාජය පිළිබඳ විස්තර කෙරෙන ආර්ථික, දේශපාලන ආදී විද්‍යාවන් සමාජ දර්ශන යටතේ ප්‍රභේද කර ඇති අතර මනස පිළිබඳ මනස් දර්ශන යටතේ අධ්‍යයනයන් සිදු කර තිබේ. පුරාණ ග්‍රීක භාෂාවේ භාවිත වූ 'සයිකි' (psyche) යන පදයෙන් ගම්‍ය වූයේ මනස, ආත්මය සහ ඥානය යන අර්ථයන්ය. 'logos' යනු ග්‍රීක භාෂාවෙන් අධ්‍යයනය හෙවත් සාකච්ඡාව යන අරුතයි. psyche + logos යන වචන ද්විත්වය එක් වීමෙන් psychology යන වචනය සෑදී තිබේ. ග්‍රීකයන්ගේ මතයට අනුව මනස හා ආත්මා එකකි.[2] නමුත් ඉන්දියානු දර්ශන වලට අනුව මනස යනු ආත්මීය චිත්ත, චෛතසික, විඥාන යන විද්‍යාවලට වෙනස් වූ අර්ථ සහිත සංකල්පයකි. ඉන්දීය දාර්ශනික මතයට අනුව මනස ශරීරය තුළ පිහිටි ඉන්ද්‍රියකි. භාරතීය දාර්ශනික මත ඔස්සේ ගොඩනැගුණු ආයුර්වේද දර්ශනය පෙන්වා දෙන්නේ මිනිසා මනස නිසාම අනෙකුත් සත්ත්වයන්ගෙන් ශ්‍රේෂ්ඨත්වය ලබා ඇති බවයි.[3] මිනිසාගේ ශ්‍රේෂ්ඨත්වය ගුණයන් හා බැඳී පවතින්නේ මිනිසා සතු සුවිශේෂී චින්තන ශක්තිය හෙවත් සිතීමේ හැකියාව මතයි. සංස්කෘත ඉංග්‍රීසි ශබ්දකෝෂයේ **මනනාත් මනුෂයඃ**[4] යනුවෙන් සඳහන් වී ඇත්තේ එබැවිණි. ආත්‍රේය ආරණ්‍යක ග්‍රන්ථයේ මනස පිළිබඳව දැක්වෙන විවරණයේ සඳහන් වන්නේ මිනිසා වෙනත් සතුන්ට වඩා සුවිශේෂී වන්නේ අනාගතය ඔස්සේ මනස මෙහෙය වීමට හා අතීතය මතක තබා ගැනීමට ඇති හැකියාවත් නිසා බවයි. ඉන්දීය දාර්ශනික පසුතලය දෙස බලන කල්හි මනස පිළිබඳ නිශ්චිතව ම පිළිගත් එක් සිද්ධාන්තයක් හමු නොවේ.

**මනස** යන වචනයේ අර්ථ නිරූපණයේ දී සංස්කෘත ඉංග්‍රීසි ශබ්දකෝෂය අර්ථ කිහිපයක් ලබා දෙයි. එනම්, මනස, හදවත, තේරුම් ගැනීම හා ඥානය සහ අරුත්ය. වේද හා බ්‍රාහ්මණ ග්‍රන්ථයන්හි මනස පිළිබඳ සාහිත්‍යමය අර්ථ නිරූපණයන් දැක්වෙන අතර එය 'මැනීම' යන අරුත් දෙයි. සියලු ම භාරතීය දාර්ශනිකයන් මනස අති සියුම් බව පිළිගන්නා අතර එය ජීවී මිනිසාගේ ක්‍රියාකාරී බලය බව ද පෙන්වා දෙයි. ආයුර්වේද සිද්ධාන්තවලට

අනුව රෝග සෑදීම හා ජීවිතයේ සතුට සඳහා මූලික පදනම සපයන්නේ මනස යි. [5]

ශරීරම් සත්‍වසංඥංච ව්‍යාධිනාමාක්‍ෂයෝමතඃ

තථා සුඛානාං යොගස්තු සුඛානාම් කාරණම් සමඃ

භාරත දර්ශනවලට අනුව මනස වඩා සංකීර්ණ වූ ද විස්තීර්ණ වූ ද ද්‍රව්‍යයකි. ග්‍රීක දර්ශනයට අනුව මනස සිරුරින් බැහැර කළ හැකි වස්තුවකි. නමුත් භාරත දර්ශන ශරීරය හා කය එකම ප්‍රපංචයක පිහිටා ක්‍රියා කරන බව සඳහන් කරයි. මෙම හේතුව නිසා ඉන්දියානු මනෝ අධ්‍යයන, බටහිරට සමානව විද්‍යාත්මක රාමු තුළ ගොඩනැගුනේ නැත. ආයුර්වේද දර්ශනයට අනුව මිනිසා යනු ශරීරය, පංචඉන්ද්‍රියය, මනස හා ආත්ම යන කාණ්ඩ හතරකින් සමන්විත වූ සත්ත්වයෙකි ශරීරයේ රෝග තත්ත්වයන් ඇති කරලීමට වාත, පිත්ත, කඵ යන දෝෂත්‍රය හේතුවනවා මෙන්ම මනසේ රෝග සඳහා නිදාන වන්නේ රජස් තමස් යන ගුණ ද්විත්වය යි. ආයුර්වේද මතයට අනුව මනසේ ඇති සත්ත්ව ගුණ රෝග ඇති කිරීමට හේතු නොවේ.

ග්‍රීසියේ සම්භවය වූ බටහිර මනෝ විද්‍යාව ප්‍රධාන ප්‍රභේද දෙකක් ඔස්සේ සංවිධානය වී තිබේ. මෙයින් පළමු වැන්න දාර්ශනිකයින් විසින් පර්යේෂණාත්මකව වර්ධනය කරන ලද පර්යේෂණ මනෝවිද්‍යාවයි. දෙවැන්න වෛද්‍යවරුන් හා ප්‍රතිකාරකයන් විසින් දියුණු කරන ලද මනෝ චිකිත්සාවයි. පර්යේෂණ මනෝවිද්‍යාව ප්ලේටෝ (ක්‍රි.පූ. 429.-347), ඇරිස්ටෝටල් (ක්‍රි.පූ.384--.322) සහ ඩේකාට් (ක්‍රි.ව.1596.-1650) ඔස්සේ වර්තමානයේ පවතින නූතන මනෝ චිකිත්සාව තෙක් ප්‍රගමනය වී ඇත. ග්‍රීක, රෝම, සහ අරාබි වෛද්‍යවරුන් මඟින් දියුණු කරන ලද මනෝ චිකිත්සාව වර්තමානයේ දී මනෝ වෛද්‍ය විද්‍යාව, මනෝප්‍රතිකාර විද්‍යාව හා මනෝ උපදේශනය යන අංශ ලෙස විකාශනය වී තිබේ. ග්‍රීක මතයට අනුව මනෝ විද්‍යාව යනු මනස පිළිබඳ දර්ශනයකි.

ආයුර්වේද දර්ශනයට අනුව මනසට කරනු ලබන චිකිත්සාව සත්වාවජය චිකිත්සාව යි. ශාර්ඞ්ගධර සංහිතාවට අනුව ආධ්‍යාත්මික හා ආගමික දැනුම මත ඥානය, විඥානය, ධෛර්ය, ස්මෘතිය, ඉවසීම යන කරුණු පෙරදැරි කරගෙන මනෝ චිකිත්සාව කළ යුතුවේ. ධනාත්මක සෞඛ්‍ය ප්‍රතිඵල සඳහා මනෝ ස්වස්ථාව ඉතාමත්ම අත්‍යාවශ්‍ය කරුණක් බව ආයුර්වේද පිළිගැනීමයි. භාරතීය දර්ශන වලට අනුව මනස යනු ප්‍රධාන ඉන්ද්‍රියන් හයෙන් එකකි. මෙය චක්‍ෂු ආදි වූ පංච ඉන්ද්‍රියන්ගෙන් ග්‍රහණය කර ගත නො හැකි හෙයින් හා අනෙක් ඉඳුරන් පාලනය කරන හෙයින් අති ඉන්ද්‍රියයක් ලෙස හඳුන්වයි. මනස චක්‍ෂු, ශ්‍රෝත්‍ර, ඝ්‍රාන, ජිහවා, චර්ම යන ඥාන ඉන්ද්‍රිය පහ සමඟ මෙන්ම හස්ත, පාද, වාග්, ගුද, ලිඟු යන කර්ම ඉන්ද්‍රිය සමඟ ද ක්‍රියා කරන හෙයින් උභය ඉන්ද්‍රියක් නමින් හඳුන්වයි. මෙම ද්විත්ව ක්‍රියාකාරී ගුණය නිසා මිනිසාගේ මනස නිරෝගී නම් ඇස් ආදි ඉඳුරන්ගේ දුබලතා තිබුණ ද සමාජයේ යහපත් ජීවිතයක් ගෙනයාමට මිනිසාට හැකියාව ලැබේ. භාරතීය වෛශේෂික දර්ශනයට අනුව මනසේ

ලක්ෂණය වන්නේ ඉන්ද්‍රිය අතර ගැටෙමින් ඥානයේ පැවැත්ම හා නො පැවැත්ම පිළිබඳව ආත්මා සමඟ සම්බන්ධ වීමයි.[6]

වෛශේෂික දර්ශනයට අනුව මනසට අයත් ගුණ හා කර්ම (ක්‍රියා) වෙන වෙනම පවතී. ආයුර්වේදය පිළිබඳ මූලික ග්‍රන්ථ කතුවරයෙක් වන චරක ඍෂිවරයා පෙන්වා දෙන්නේ එහි ප්‍රධාන ගුණ දෙක අනුත්වය හා ඒකත්වය බව යි. පංච ඉන්ද්‍රියන් විසින් එකවර එකම මොහොතක අරමුණු ග්‍රහණය කර ගත්ත ද මනසේ ඒකීය ස්වභාවය හේතුවෙන් එම අරමුණු මනස හරහා ප්‍රේරණය වන්නේ එකවරකට එක බැගිනි. නමුත් මනසේ ඇති සියුම් ස්වභාවය නිසා ඒ සියල්ල එනම් ප්‍රතික්‍රියා සියල්ල එකවර මනස ග්‍රහනය කරනවා වැනි සාවද්‍ය හැඟීමක් අප තුළ ඇති කරවයි. මනසේ ඇති මෙම සූක්ෂ්ම ස්වභාවය භාරතීය දාර්ශනිකයන් විස්තර කරන්නේ උත්පල ශතපත්‍ර න්‍යායෙනි. එනම් නෙළුම් පොහොට්ටුවක් ගෙන එය අල්පෙනිත්තකින් එකවර හරස් අතට සිදුරු කළහොත්, එම අල්පෙනිත්ත එකවරකට සිදුරු කරන්නේ එක මල් පෙත්තක් පමණි. නමුත් ඉතා මඳ වේලාවක් තුළ ඉතා සියුම්ව සියලු ම පෙති සිදුරු කරයි. එපරිදි ම මනස සියලු ම ඉන්ද්‍රියන් එකවර ග්‍රහනය කරන්නාසේ පෙනීම හා දැනීම මායාව බව භාරතීය දාර්ශනිකයන් පෙන්වා දෙයි. චරක ඍෂිවරයා පෙන්වා දෙන පරිදි ජීවියාගේ ශරීර ග්‍රහනය පිළිබඳ සාධනය මනස යි. ඒ මනස නිතරම ජීවාත්මා ස්පර්ශ කරමින් එය ශරීරය සමඟ සම්බන්ධ කරයි.[7]

ආයුර්වේද දාර්ශනික මතයට අනුව මනසේ සත්ත්ව ගුණ බහුල වූ කල්හි එය දෙවනි ජන්මය තෙක් බලපවත්වයි. එසේ බලවත් වූ මනස සහිත වූ ජීවිතයට තම පෙර ජන්මය ස්මරණය කිරීමේ ශක්තිය ලැබෙයි. මනසේ ප්‍රකෘති ස්වභාවය චින්තනය හෙවත් සිතීම යි. එම නිසා මෙම සිතීම ද හීන, මිත්‍යා අති වශයෙන් ක්‍රියා කිරීමෙන් මනසේ අසාමාන්‍ය ලක්ෂණ පහළ වීමට හැකියි. ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය, මානය, මෛත්‍රිය, කරුණාව, ආදරය, උනන්දුව, අලසබව, මෘදුබව, රළු බව, උද්වේගවත් බව, ස්ථාවර බව, චංචල බව, භය, ආදි වූ විවිධ චින්තන මනසේ පහළ විය හැකි ය. නමුත් මෙම සිතුවිලි හෝ චින්තාවන් වරකට ඇතිවන්නේ ද එක බැගිනි. චරක සංහිතාව මනෝ අර්ථ විස්තරකර ඇත්තේ මෙසේය. චින්ත්‍ය, විචාර, ඌහ්‍ය, ධ්‍යෙය, සංකල්ප යනුවෙනි. එමෙන්ම මනසෙන් පංච ඉන්ද්‍රියන් පාලනය කරයි. (ඉන්ද්‍රියාභිග්‍රහ) ඒ අතරම තමාද දමනය කරගනී. (ස්වස්‍ය නිග්‍රහ) තර්ක සංග්‍රහයට අනුව මනස විශේෂිත ඉන්ද්‍රියකි. චින්ත්‍ය යනු සිතීමයි. එම සිතුවිල්ල විශ්ලේෂණය කිරීම විචාරය යි. ඒ පිළිබඳ අවධානය ධ්‍යෙය යි. ඒ පිළිබඳ කළ යුතු නො කළ යුතු දේ තීරණය කිරීම සංකල්පය යි. රෝග සෑදීමට මෙන්ම රෝග උත්සන්න වීමට ද මනසේ ස්වභාවය හේතුවන බව ආයුර්වේද පිළිගැනීම යි. මනස තමාව පාලනය කරනු ලබන්නේ ස්මෘති ශක්තිය මත යි. මනසට තමාව පාලනය කර ගැනීමට නො හැකි කල්හි බාහිර ආයාසයන් මඟින් පාලනය කළ යුතුය. මෙලෙස පාලනය කිරීම යෝග දර්ශනයේ ප්‍රත්‍යාහාර වශයෙන් විස්තර වේ. ප්‍රඥාපරාධ හේතුවෙන් මනස විනාශකාරී අරමුණු හා ගැටීමෙන් විවිධ මනෝරෝග මෙන්ම කායික රෝගද හට ගැනීමේ අවකාශ තිබේ. මනස සඳහා කරනු ලබන චිකිත්සාව සත්වාවජය චිකිත්සාව යි. බෞද්ධ දර්ශනය මනස හික්මවීම කුළු හරකෙක

මෙල්ල කරනවාට වඩා බැරෑරුම් කාර්යයක් බව භගවත්ගීතාවේ ද මනස පාලනය ඉතා අපහසු බව දක්ව අභ්‍යාසයෙන් ම කළ යුතු අතර යෝග දර්ශනයේ මෙය හඳුන්වා දී තිබේ. අමරකෝෂයට අනුව චිත්ත, හෘද තේරුම ලබා දෙන වචන වේ. මනස පිහිටි ස්ථානය පවතී. අෂ්ඨාංගහෘදයට අනුව මනස උරසේ පිහිටි හෘද අනුව ද මනස පිහිටා ඇත්තේ හෘදයේ ය. එම හ කරන්නාවූ මහා මූලි ප්‍රනාල සහිත උරසේ පිහිටි හෘදය අනුව ද කලලයේ මුලින්ම හටගන්නා හෘද අංකුරයේ මේ අනුව බලන කල්හි ස්වස්ථ බව සඳහා මනසේ බ බව පෙනේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


01. දයා එදිරිසිංහ, (1998) මනෝ විද්‍යාව ගුරු කුල හ තරංජි ප්‍රින්ටස්, නාවින්න. පිටු. 01

02. එම.

03. Y.C. Mishra (2005), Pdartha Vigana, Chukhamb p.168.

04. සංස්කෘත ඉංග්‍රීසි ශබ්දකෝෂය. සර් මොනියර් විලිය

05. චරක සූත්‍ර 1/55

06. චරක ශාරීර 1/18-.19

07. චරක ශාරීර 3/19

08. භගවත්ගීතාව 6/33

09. චරක සූත්‍ර 30/-3